# මධ්‍ය වාර පරීක්ෂණය - 2017
# බුද්ධ ධර්මය
# 9 ශ්‍රේණිය

**නම/විභාග අංකය :** **කාලය : පැය 02 යි**

**I පත්‍රය**

- **අංක 01 සිට 20 දක්වා එක් එක් ප්‍රශ්ණයට ගැළපෙන අදාල පිළිතුරු වලින් වඩාත්ම ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. බුදු දහමට අනුව මෙලොවදීම විපාක දෙන කර්මය හඳුන්වන්නේ,
   1. දිට්ඨධම්ම වේදනීය කර්මය නමිනි
   2. උපපජ්ජවේදනීය කර්මය නමිනි
   3. අපරාපරීයවේදනීය කර්මය නමිනි
   4. අහෝසි කර්මය නමිනි

02. බුදුදහමේ අත්තූපනායික ධර්ම පරියාය නමින් හැඳින්වෙන්නේ,
   1. තමා උසස් කොට අනුන් පහත් කොට සැලකීමය.
   2. අනුන් උසස් කොට තමා පහත් කොට සැලකීමය.
   3. තමා හා අනුන් යන දෙකොටසම උසස් කොට සැලකීමය.
   4. තමා උපමාවට ගෙන අනුන්ට හිංසා පීඩා කිරීමෙන් වැළකීමය.

03. “යේ ධම්මා හේතුප්පභවා” යන ගාථාව ඇසීමෙන් ධර්මය අවබෝධ කරගත්තේ,
   1. අස්සජී හිමි ය. 3. පස්වග තවුසන් ය.
   2. උපතිස්ස පිරිවැජියා ය. 4. යසකුල පුත්‍රයා ය.

04. බුදුරජාණන් වහන්සේ අවසන් වස් කාලය ගත කළේ,
   1. සැවැත් නුවරය. 3. බේලුව ගමේ ය.
   2. කුසිනාරා නුවරය. 4. පාවා නුවර ය.

05. බෞද්ධයෙකු විසින් දැක සංවේගය උපදවා ගත යුතු ස්ථානයක් නොවන්නේ,
   1. ලුම්බිණිය 3. කුසිනාරාව
   2. බුද්ධගයාව 4. ජේතවනාරාමය

06. සතර සෘද්ධිපාද අතරට නොගැනෙන්නේ,
   1. ඡන්ද 3. චිත්ත
   2. දෝස 4. විරිය

07. සෝපාදිසේස පරිනිබ්බානධාතු ලෙස සැලකෙන්නේ,
   1. පිරිනිවන් පෑමයි. 3. ක්ලේශ පරිණිර්වාණය යි.
   2. ස්කන්ධ පරිණිර්වානය යි. 4. දුක නැති කිරීමයි.

08. බුදුරජාණන් වහන්සේ පටිච්ච සමුප්පාදය මෙනෙහි කළේ,
   1. පළමු සතියේදී ය. 3. තෙවන සතියේදී ය.
   2. දෙවන සතියේදී ය. 4. පස්වන සතියේදී ය.

09. බුදුරජාණන් වහන්සේ දේශනා කළ දම්සක්පැවතුම් සූත්‍රය ඇසීමෙන් පළමුවෙන්ම ධර්මය අවබෝධ කර ගත්තේ,
   1. අසිත තාපසතුමාය. 3. භද්දිය තාපසතුමාය.
   2. වප්ප තාපසතුමාය. 4. කොණ්ඩඤ්ඤ තාපසතුමාය.

10. ජාති ජරා මරණ ආදී සියළු දුක් ඇතිවීමට හේතුවන්නේ,
    1. ද්වේශය යි.
    2. මෝහය යි.
    3. තණ්හාව යි.
    4. ඉපදීම යි.

11. අප සිත් තුළ මුල් බැස පවත්නා ඇලීම, ආශාව, ගිජුකම හඳුන්වන්නේ,
    1. රාග චේතනාව නමිනි
    2. ද්වේශ චේතනාව නමිනි
    3. මෝහ චේතනාව නමිනි
    4. ඊර්ෂ්‍යාව නමිනි

12. පවුකිරීමට ඇති ලැජ්ජාව හා බිය බුදුදහමෙහි උගන්වන්නේ,
    1. චාරිත්‍ර වාරිත්‍ර නමිනි.
    2. විරති සමාදාන නමිනි.
    3. හිරි ඔත්තප්ප නමිනි.
    4. ධම්මචරියා සමචරියා නමිනි.

13. ආර්ය මහා සංඝරත්නයේ ගුණ සංඛ්‍යාත්මක වශයෙන්,
    1. හයකි.
    2. හතකි.
    3. අටකි.
    4. නමයකි.

14. ගිහියාගේ නිත්‍ය ශීලය වන්නේ,
    1. අටසිල් ය.
    2. පන්සිල් ය.
    3. දස සිල් ය.
    4. ආජීව අෂ්ටමක සිල් ය.

15. සිහියෙන් හුස්ම ගැනීම කෙරෙහි සිත පිහිටුවා වඩන භාවනා හඳුන්වන්නේ,
    1. ආනාපානාසති භාවනාව නමිනි.
    2. මෛත්‍රී භාවනාව නමිනි.
    3. බුද්ධානුස්සති භාවනාව නිමිනි.
    4. මරණානුස්සති භාවනාව නමිනි.

16. බුදුරජාණන් වහන්සේගේ අන්තිම බුද්ධ වචනයේ සඳහන් සූත්‍රය වන්නේ,
    1. ධම්මචක්කප්පවත්වන සූත්‍රය යි.
    2. අනත්තලක්ඛණ සූත්‍රය යි.
    3. මහා පිරිණිබ්බාණ සූත්‍රය යි.
    4. ආදිත්ත පරියාය සූත්‍රය යි.

17. බුදු දහමට අනුව බෞද්ධ භාවනාවේ ප්‍රධාන ප්‍රභේද දෙක වන්නේ,
    1. සමථ හා මෛත්‍රී භාවනාව යි.
    2. ආනාපානසති හා විදර්ශනා භාවනාව යි.
    3. මෛත්‍රී හා අනාපානසති භාවනාව යි.
    4. සමථ හා විදර්ශනා භාවනාව යි.

18. "වත්තං න පරිපූරෙන්තෝ න සීලං පරිපූපරතී" යන ගාථා පදයෙහි අර්ථය වන්නේ,
    1. බාලයන් ඇසුරු කිරීම නුසුදුසු වන බවයි.
    2. සීලය ආරක්ෂා කළ යුතු බවයි.
    3. වත් පිළිවෙත් නොපුරන්නගේ සීලය සම්පූර්ණ නොවන බවයි.
    4. වත් පිළිවෙත් කිරීම සීලයට වඩා උසස් වන බවයි.

19. භාවනාව වැඩීමේදී අර්ධ පර්යන්තයෙන් සිටීම යනු,
    1. පිරිමි දරුවන් භාවනා කිරීමට වාඩිවන ආකාරය යි.
    2. ගැහැණු දරුවන් භාවනා කිරීමට වාඩිවන ආකාරය යි.
    3. මේ දෙපිරිසම භාවනා කිරීමට වාඩිවන ආකාරය යි.
    4. වැඩිහිටියන් භාවනා කිරීමට වාඩිවන ආකාරය යි.

20. බුද්ධමාතා යානුවෙන් ප්‍රකට වූයේ,
    1. විශාඛා උපාසිකාව යි.
    2. මහා ප්‍රජාපතී ගෝතමිය යි.
    3. සාමාවතී බිසව යි.
    4. යශෝධරා දේවිය යි.

# 9 ශ්‍රේණිය
## II පත්‍රය

- **පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න 04ක් තෝරාගෙන ප්‍රශ්න 05කට පිළිතුරු සපයන්න.**

**(01)**

1. සතර සංග්‍රහ වස්තුවලින් දෙකක් නම් කරන්න.
2. අල්පේච්ඡතාව යනු කුමක්ද? අර්ථ දක්වන්න.
3. ධර්මරත්නයේ ගුණ අතරින් 02ක් ලියා දක්වන්න.
4. බුදුරජාණන් වහන්සේගේ අවසන් බුද්ධ වචනය ගෙනහැර දක්වන්න.
5. "ආපදාසු ඛො මහාරාජ ථාමො වේදිතබ්බො" යන්නෙහි අර්ථය ලියන්න.
6. බුදුරජාණන් වහන්සේ තුළ තිබූ නායකත්ව ලක්ෂණ 02ක් නම් කරන්න.
7. දසකුසල් හඳුන්වන වෙනත් නම් 02ක් ගෙනහැර දක්වන්න.
8. බුදුදහමට අනුව ජීවිතය හා ලෝකය පිළිබඳ නිවැරදි අවබෝධයක් ඇතිකර ගැනීමට උපකාර වන කරුණු 02 කුමක්ද?
9. විහාරස්ථානයකදී පිළිපැදිය යුතු වත්පිළිවෙත් 02ක් ලියන්න.
10. සිව්බඹ විහරණ වලින් 02ක් නම් කරන්න.

**(02)**

1. විපාක දෙන ආකාරය අනුව කර්මයේ ප්‍රභේද 02ක් ලියන්න.
2. ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න.
3. කර්ම විපාක පිළිබඳ විශ්වාස ඇතිව කටයුතු කිරීමෙන් යහපත් සමාජයක් බිහිකළ හැකිය. ඒ පිළිබඳව ඔබේ අදහස් පැහැදිලි කරන්න.

**(03)**

1. ආපදාවකට සාර්ථකව මුහුණ දුන් ආකාරය දැක්වෙන ජාතක කථා දෙකක් නම් කරන්න.
2. ආපදාවක් සාර්ථකව ජය ගැනීම සඳහා අප තුල තිබිය යුතු ගුණාංග 03ක් නම් කරන්න.
3. ඔබ ආපදාවක් සාර්ථකව ජය ගන්නා ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

**(04)**

1. භාවනාව යනු කුමක්ද? අර්ථ දක්වන්න.
2. ආනාපානසති භාවනාව වඩන අයුරු කෙටියෙන් පැහැදිලි කරන්න.
3. ශිෂ්‍යයකු වශයෙන් ඉගෙනීම් කටයුතු සාර්ථක කරගැනීම සඳහා භාවනාවෙන් ලද හැකි ප්‍රයෝජන පැහැදිලි කරන්න.

**(05)**

1. මහා ප්‍රජාපතී ගෝතමී තෙරණිය ලත් අග තනතුර නම් කොට එහි අර්ථය ගෙනහැර දක්වන්න.
2. එම තෙරණින් වහන්සේගේ චරිතයෙන් ගතහැකි ආදර්ශ 03ක් නම් කරන්න.
3. මහා ප්‍රජාපතී තෙරණිය බුදුරජාණන් වහන්සේගේ ගෞරවාදරයට පාත්‍රවූ ආකාරය පැහැදිලි කරන්න.

**(06)**

1. "චරං චේ නාධිගච්ඡෙය්‍ය" යන ගාථාව සම්පූර්ණ කරන්න.
2. එහි සරළ අදහස ලියා දක්වන්න.
3. ගුණ නුවණ නැති අයෙකු ඇසුරු කිරීමේ ආදීනව පැහැදිලි කරන්න.

**(07)**

1. “උද්ධං සමණබ්‍රාහ්මණා” යන්නෙහි අර්ථය ලියන්න.
2. ගිහියන්ගෙන් මහා සංඝරත්නයට ඉටුවිය යුතු යුතුකම් 03ක් ගෙනහැර දක්වන්න.
3. ස්වාමීන් වහන්සේලාගෙන් ගිහියන්ට වන සේවාව පැහැදිලි කරන්න.

## 9 ශ්‍රේණිය
## පිළිතුරු පත්‍රය - I කොටස

| ප්‍රශ්නය | පිළිතුර | ප්‍රශ්නය | පිළිතුර |
|---|---|---|---|
| **1** | 1 | **11** | 1 |
| **2** | 4 | **12** | 3 |
| **3** | 2 | **13** | 4 |
| **4** | 3 | **14** | 2 |
| **5** | 4 | **15** | 1 |
| **6** | 2 | **16** | 3 |
| **7** | 3 | **17** | 4 |
| **8** | 1 | **18** | 3 |
| **9** | 4 | **19** | 2 |
| **10** | 3 | **20** | 2 |

## 9 ශ්‍රේණිය
## පිළිතුරු පත්‍රය - I I කොටස

(01)

1. දානය/ ප්‍රියවචනය / අර්ථචර්යාව /සමානාත්මතාවය
2. ආශා අඩු බව හෙවත් බලාපොරොත්තු අඩු බව
3. ස්වාක්ඛාත / සන්දිට්ඨික / අකාලික / එහිපස්සික / ඕපනයිකො/ පච්චත්තං/ වේදිතබ්බෝ විඤ්ඤූහි
4. "හන්දදානි භික්ඛවේ ආමන්තයාමි වෝ වයධම්මා සංඛාරා අප්පමාදෙන සම්පාදේථ" (මහණෙනි මම දැන් ඔබ අමතමි. සියළු සංස්කාරයෝ නැසෙන සුළුය. නොපමාව කුසල් දහම්හි යෙදෙන්න.)
5. මහරජ වීර්යය දැනගත යුත්තේ ආපදාවන්හිදීය.
6. ආදර්ශමත්බව / සමානාත්මතාවය / සුදුසු පරිදි වගකීම් පැවරීම / තම අනුගාමිකයන් ආරක්ෂා කිරීම / ඉවසීම / යථාවාදී තථාකාරී ගුණය / අනුකම්පාව / සුහදශීලීබව / නිවැරදි දර්ශනයක් තිබීම / (මේවා අතුරින් දෙකක් ඇත්නම් ලකුණු දෙන්න)
7. ධම්මචරියා / සමචරියා
8. කරුණු අසා දැනගැනීම / ඥානවන්ත ලෙස කල්පනා කිරීම
9. හිස්වැසුම් පාවහන් ගැලවීම / අත් ධෝවනය කිරීම / මළුව ඇමදීම / සීලයක පිහිටා වන්දනා කිරීම
10. මෛත්‍රී / කරුණා/ මුදිතා / උපෙක්ෂා

(02)

1. ගරුක කර්මය / ආසන්න කර්මය / ආචින්න කර්මය / කටත්තා කර්මය
2. අදාළ පිළිතුරට ලකුණු ලබා දෙන්න. 01 වන පාඩම 04 වන පිටුව
3. හොඳ නරක කර්මයන්ට අනුරූපීව විපාක ඇති බව තේරුම් ගෙන අවබෝධයෙන් ලියන ලද පිළිතුරකට සම්පූර්ණ ලකුණු ලබා දෙන්න.

(03)

1. අපණ්ණක ජාතකය / වණ්ණුපත ජාතකය
2. කම්පා නොවීම/ප්‍රඥාවෙන් යුක්තවීම/උත්සාහයෙන් යුක්ත වීම/විමසුම් නුවණින් යුක්තවීම ආදී කරුණු(4 වන පාඩමට අදාලව)
3. සාර්ථකව ලියන ලද පිළිතුරකට සම්පූර්ණ ලකුණු ලබා දෙන්න.

(04)

1. කුසල් දහම් වැඩි දියුණු කිරීමේ මානසික අභ්‍යාසය භාවනාවයි.
2. පූර්ව කෘතයේ සිට පියවර ඔස්සේ භාවනාව වැඩිය යුතු ආකාරය ලියා ඇති පිළිතුරකට සම්පූර්ණ ලකුණු ලබා දෙන්න.
3. භාවනාවෙන් ලද හැකි ප්‍රයෝජන පිළිබඳ අවබෝධයෙන් ලියන ලද පිලිතුරකට සම්පූර්ණ ලකුණු ලබා දෙන්න.

(05)

1. චිරරාත්‍රඥ තනතුර - දීර්ඝ කාලීන ශාසනික අත්දැකීම් ඇති
2. අනතිමානී බව / සාමකාමී බව /ආත්මාර්ථකාමී නොවීම/උතුම් මව්ගුණ/නායකත්වයේ හා කැපවීමේ ගුණය/ නිරහංකාර බව
3. චිරරාත්‍රඥ තනතුර ලබාදීම / භික්ෂුණී ශාසනයේ ප්‍රධානියා බවට පත්කිරීම/ රෝගී වූ කල සුව දුක් බැලීමට යාම / මෙහෙණවරට ගොස් රෝගී වූ භික්ෂුණීන්ට අවවාද දීමට අනුදනිමියි විනය නීතියක්ද පැණවීම / සුළු මවට පසුගමන් යෑම ආදී කරුණු ඇතුළත් පිළිතුරකට සම්පූර්ණ ලකුණු ලබා දෙන්න.

(06)

1. චරං චේ නාධිගච්ජෙය්‍ය - සෙය්‍යං සදිසමත්තනෝ
   ඒකචරියං දළ්හං කයිරා - නත්ථි බාලේ සහායතා
2. ඇසුරු කිරීමට කෙනෙකු සොයන්නෙකු තමාට වැඩිතරම් වූ හෝ සමාන වූ හෝ කෙනෙකු නොලද හොත් තනිව වාසය කළ යුතුය. බාලයා ඇසුරු නොකළ යුතුය.
3. සාර්ථක පිළිතුරකට සම්පූර්ණ ලකුණු ලබා දෙන්න.

(07)

1. උඩ දිශාව මහණ බමුණෝය.
2. මෛත්‍රී සහගත කාය කර්මයෙන් සැළකීම.
   මෛත්‍රී සහගත වාග් කර්මයෙන් සැළකීම.
   මෛත්‍රී සහගත මනෝ කර්මයෙන් සැළකීම.
   ගේ දොර සඟරුවනට විවෘතව තැබීම.
   සිව්පසයෙන් උපස්ථාන කිරීම.
3. භික්ෂූන් වහන්සේලාගෙන් ගිහියන්ට ඉටුවන යුතුකම් හා උපතේ සිට මරණය දක්වා කරනු ලබන සේවාවන් ද ඇතුලත් පිළිතුරකට සම්පූර්ණ ලකුණු ලබා දෙන්න.